**ජා-ඇල නගර සභාව**

**-----------------------**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**--------------------**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 26 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 27 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාඇල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.5,492,515 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | ගිණුම්වල අවශ්‍ය ගැළපීම් කළ යුතු වේ. | අවසාන ගෙවීම් වාර්තාවේ දැක්වෙන වටිනාකම්ද විචලනය විය හැකි බැවින් ඇස්තමේන්තු වටිනාකම හා ලැබීම් අතර ඇතිවන වෙනස ඊළඟ වසරේදී ගැළපීම් කරනු ලැබේ. |
| (ii) | ටෙන්ඩර් ඇප සඳහා වසර අටකට පෙර ලැබුණු වටිනාකම රු.200,000 ක් වූ අගරු චෙක්පත සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | උපලබ්ධි නොවූ චෙක්පත් ආදායමට ගත නොහැක. | 2019 වසරේ අවසාන ගිණුම සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | 2017 වර්ෂය තුළ සභාව විසින් මිලදී ගෙන තිබූ රු.1,531,060 ක් වටිනා ත්‍රීරෝද රථ දෙක ප්‍රාග්ධනිත කර නොතිබුණි. | අදාල වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වසරේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 02 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.6,459,002 ක වෙනසක් පැවතුණි. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | නිවැරදි කිරීම 2019 වසර අවසාන ගිණුම් සැකසීමට පෙර සිදුකිරීමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා කොම්පෝස්ට් අංගනය ඉදිකිරීමේදී 2012 වසරේදී ගෙවා තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්වලින් රු.153,749 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි. | ගෙවීම් කිරීමේදී ගෙවා තිබූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත්කර නැත. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) නගර සභා ආඥා පනතේ 77 වන වගන්තිය | - | කොට්ඨාශ අංක 05 හි අනවසර කඩ 23 ක් ඉදිකර තිබුණද නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ඒවා කඩා දැමීමට හෝ ඉවත් කරවීමට කටයුතු නොකොට වරිපනම් අංක ලබා දී නීත්‍යානුකූල තත්ත්වයට පත් කර තිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධව නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | එම කඩ ඉවත් කිරීම සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය මගින් අධිකරණයේ නඩුවක් දැනටමත් පවරා ඇති අතර අධිකරණ නියෝගය ලද පසු මෙම කඩ ඉවත් කිරීම සිදු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි - | | | |
| (i) මුදල් රෙගුලාසි 272 | 2007 සිට 2011 දක්වා වර්ෂයන්වල මාස 09 ක වවුචර් අස්ථානගතවීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | දැනට අප විසින් ලේඛනාගාරය ක්‍රමවත් කොට ලිපි ලේඛන සුරක්ෂිතව තබා ගැනීමට කටයුතු කොට ඇත. |
| (ii) මුදල් රෙගුලාසි - 315(3) හා 316(1)(ඇ) | 2010 සහ 2011 වර්ෂයන්වල මාස 02 ක ලදුපත් හා උපපත්‍රිකා පොත් අස්ථානගතවීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | ලදුපත් හා උප පත්‍රිකා සුරක්ෂිතව තැබිය යුතු අතර පාලන පද්ධතිය වැඩි දියුණු කළ යුතු වේ. | උප පත්‍රිකා පොත් අස්ථාන ගත වීමක් සම්බන්ධව මා වෙත වාර්ථා වී නොමැත. දැනට අප විසින් ලේඛනාගාරය ක්‍රමවත් කොට ලිපි ලේඛන සුරක්ෂිතව තබා ගැනීමට කටයුතු කොට ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 51,255,753 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.29,109,990 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | ---------- | --------- | --------- | ---------- | ----------- | ------------- | --------- | ---------- | ---------- |
| | | රු.'000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් හා බදු | 42,950 | 44,211 | 27,602 | 23,558 | 36,675 | 41,804 | 26,630 | 21,011 |
| (ii) | කුලී | 9,337 | 9,624 | 9,624 | - | 8,560 | 8,875 | 8,835 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 738 | 1,166 | 1,166 | - | 462 | 1,330 | 1,330 | - |
| (iv) | වෙනත් ආදායම් | 94,614 | 50,626 | 50,626 | 1,522 | 64,369 | 28,626 | 28,626 | 172 |

2.2.2 වරිපනම් හා බදු

----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ---------------------- |
| (අ) | ඉකුත් වර්ෂය අවසානයට හිඟ වරිපනම් වටිනාකම වූ රු.21,010,864 න් සමාලෝචිත වර්ෂය තුළ අය කර තිබුණේ සියයට 45 වන රු.9,484,116 ක් පමණි. එසේම සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ හිඟ වරිපනම් රු.23,558,001 න් 2019 අප්‍රේල් 30 දින වන විට රු.5,156,777 ක් පමණක් අයවී තිබූ අතර රු.18,401,224 ක මුදලක් අයකර ගත යුතුව පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම්වලින් 2019 අප්‍රේල් 30 දින වන විට රු.5,156,777 ක් අය කර ඇති අතර, එය හිඟ වටිනාකමෙන් සියයට 21.9 ක් වේ.ඉතිරිය ඉදිරි කාර්තු 03 තුළදී අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | නිර්වාස හා කඩා ඉවත් කිරීම් ලෙස රු.375,016 ක්ද, දිළිඳු සහන යටතේ රු.30,207 ක්ද වශයෙන් හිඟ වරිපනම් රු.405,223 ක වටිනාකමක් ග්‍රාම නිලධාරි නිර්දේශයක් නොමැතිව කපා හැර තිබුණි. | දිළිඳු සහන නිර්වාස හා කඩා ඉවත් කිරීම් සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරි නිර්දේශයක් ලබා ගත යුතුවේ. | සභාව විසින් හඳුන්වා දී ඇති ආකෘති පත්‍රයේ ග්‍රාම නිලධාරි මහතාගේ නිර්දේශය හා ප්‍රාදේශීය ලේකම් තුමාගේ අනුමැතිය මත තහවුරුවක් ලබා ගෙන කටයුතු කරන බව දන්වමි. |

2.2.3 බලපත්‍ර ගාස්තු

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| නගර සභා බල ප්‍රදේශය තුළ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු පනතේ අංක 17 වගන්තියේ(ඇ) | ආයෝජන මණ්ඩලය ස්ථාපිත කිරීමේ | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

ලබන ව්‍යාපාර ආයතන 08 කින් කොටස අනුව පරිසර බලපත්‍ර ගාස්තු
සමාලෝචිත වර්ෂය තුළ පරිසර අයකළ යුතු වේ.
බලපත්‍ර ගාස්තු අය කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කාර්ය සාධනය
--------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුඛ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්
-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2017 වර්ෂයේ කොන්ත්‍රාත් 06 ක් සඳහා ගිවිසුම් ගතවී තිබුණද 2019 අප්‍රේල් 30 දින වන විටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති නිමකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ගම්පෙරළිය වැඩ සටහන යටතේ ව්‍යාපෘති 05 ක් සඳහා අනුමත රු.4,500,000 ක ප්‍රතිපාදනවලින් මාර්ග සඳහා ABC මිශ්‍රණය පමණක් යොදා රු.715,858 ක් ගෙවීම් කර තිබූ අතර එම මාර්ගවල වැඩ අවසන් කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමකරවා ගත යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ විමධ්‍යගත අයවැය යටතේ හා ගම්පෙරළිය වැඩ සටහන යටතේ අනුමතවී තිබූ රු.4,049,012 ක මාර්ග සංවර්ධන ව්‍යාපෘති 05 ක් කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම් ගතවී තිබුණද එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති නිමකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව 2015-2030 කාලය තුළ ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත අනුව එක් එක් රාජ්‍ය ආයතන බැඳී පැවතුනද සභාව විසින් අරමුණු හා ඉලක්ක මැනීම හා නියාමනය කිරීම සඳහා දර්ශක හඳුනා ගැනීම, පාදක දත්ත හඳුනා ගැනීම හා වාර්ෂික ඉලක්ක හඳුනා ගැනීම සඳහා එහි ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචිත වර්ෂයේදී පිළියෙල කර නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනිමට කටයුතු කළ යුතු වේ. | අරමුණු හා ඉලක්ක නියාමනය කිරීම, හඳුනා ගැනීම, පාධක දත්ත හඳුනා ගැනීම හා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කර 2019 මාර්තු 14 දින සභා සම්මතවී ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කොටස් කර විකුණා තිබූ ලේක්සිටි ඉඩමේ ගොඩනැගිලි අයදුම්පත්‍ර 215 කින් 61 ක් පමණක් 2014 සිට 2018 දක්වා අනුමත කර තිබූ නමුත් 2018 සැප්තැම්බර් 19 දින භෞතික පරීක්ෂණ අවස්ථාව වන විට සම්පූර්ණ ඉඩමෙන් සියයට 80 කට වැඩි ප්‍රමාණයක ගොඩනැගිලි ඉදිකර හා ඉදිවෙමින් තිබුණි. නව ඉදි කිරීම් සඳහා නව තක්සේරුවක් අනුව ගාස්තු අයකර නොතිබුණු අතර 2018 සැප්තැම්බර් 30 දින වන විට අයකරන වරිපනම්වලින්ද රු.403,451 ක හිඟ ශේෂයක් විය. | නව ඉදි කිරීම් සඳහා නව තක්සේරුවක් අනුව ගාස්තු අයකළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |
| (ආ) | 2017 වර්ෂයේ වැට් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිරිනමා තිබූ ව්‍යාපෘති 17 ක් සඳහා ගෙවිය යුතු වැට් මුදල රු.2,260,628 ක් අත්හැර ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. | වැට් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් සඳහා වැට් මුදල ඇතුළත් කර ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | මෙම කර්මාන්ත සඳහා ගිවිසුම්ගතවීමේදී වැට් බදු ඇතුළත්ව ගිවිසුම්ගතවීම මඟ හැරී ඇත. එහෙත් එම ගෙවීම සිදු කිරීම වගකීමක් වන |

බැවින් මෙම මුදලින් ණයහිමි වගකීමක් ඇති කරන ලදී.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| (ආ) | රූඩ් 02 පර්චස් 30 ක් විශාල වැවල ක්‍රීඩා පිටිය ලියාපදිංචි ඔප්පුවකින් සභාවට පැවරී තිබූ නමුත් ක්‍රීඩා පිටිය හා ඇල අතර කොටසේ අනවසර ඉදිකිරීමක් සිදු කරමින් තිබූ බව 2018 සැප්තැම්බර් 18 වන දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | සභාව සතු වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| (ඇ) | ABC මිශ්‍රණය සපයා ජලය වත්කර ටොන් 08 කට නොඅඩු මාර්ග තලනයකින් කියුබ් එකක් තැලීම සඳහා ව්‍යාපෘති 05 කට විවිධ රේට් ගණන් අනුව ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරීම BSR හෝ දිස්ත්‍රික් මිල කමිටු මිල ගණන් අනුව කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| (ඇ) | නාගරික ප්‍රදේශයට අයත් අක්කර 37 රූඩ් 03 පර්චස් 28 ක් වූ ලේක්සිටි ඉඩම අනුබෙදුම් කර විකිණීමේදී 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 20(1)(අ) නියෝගය ප්‍රකාරව අනුමත කර ගෙන නොතිබුණි. සභාව වෙත වෙන්කර තිබූ C,D,G,L,H අක්ෂර දරන ඉඩම් කැබලිවලින් L කොටස අක්කර 01 රූඩ් 03 පර්චස් 26 ක වැවක් වූ අතර G ඉඩම් කැබැල්ල පිඹුරේ දක්වා නොමැති කොටසක් විය. එම කොටස් දෙකම පොදු කටයුතුවලට උචිත නොවන ඉඩම් කැබලි විය. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර පොදු කටයුතුවලට උචිත ඉඩම් කොටස් ලබා ගත යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

3.4 ප්‍රසම්පාදනය

-----------

3.4..1 සැපයීම් හා සේවා

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ---------------------- | ----------- | ----------------------------- |
| 2018 මැයි 01 සිට 2019 අප්‍රේල් 30 දක්වා වූ කාල සීමාව සඳහා ආරක්ෂක සේවාවක් සපයා ගැනීමේදී ප්‍රසම්පාදන කමිටුව මගින් නිර්දේශ කර තිබූ අවම මිල සහිත ලංසුකරු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා නොතිබූ අතර මූලික සුදුසුකම් සපුරා තිබූ අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය හා දෙවන උපරිම මිල ඉදිරිපත් කර තිබූ ලංසුකරුවන් අභිබවා තෙවන උපරිම මිල ඉදිරිපත් කර තිබූ ලංසුකරු අවම මිල හා එකඟ කොට ගෙන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මෙය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1හි (ඇ) හා (ඊ) අරමුණුවලට පටහැනි වීමකි.ඒ වන විටත් ආරක්ෂක සේවාව පවත්වා ගෙන යමින් පැවති හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ තෙවන උපරිම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයේ සේවාව සැපයීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව සෑහීමකට පත්වී නොතිබියදීත් හා ඉකුත් වර්ෂයේ විගණනය මගින් විමසුම් කර තිබියදීත් ආරක්ෂක සේවාවක් ප්‍රසම්පාදනය කර ගැනීමේදී සභාවට සපයාගත යුතු සේවාවේ ගුණාත්මක බව පිළිබඳව අවධානය යොමු කොට නොතිබුණි.තවද, ප්‍රතික්ෂේප වූ ඔවුන්ගේ ලංසුව අසාර්ථක වීමට හේතු දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2017 ආරක්ෂක සේවාව ලබා ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව හා නැවත ලේකම් විසින් පත්කරන ලද උප පොලිස් පරීක්ෂකවරයෙකු ඇතුලු 05 දෙනෙකුගෙන් යුත් ඇගයීම් කමිටුව විසින් ලබා දී ඇති තීරණය සලකා කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති බව දන්වමි. |

3.4.2 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| | ---------------------- | ----------- | --------------- |
| (අ) | නගර සභා කාර්යාලය අභ්‍යන්තරයේ පිගන් ගඩොල් ඇතිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ වාර්තා ගොනුවේ ඇතුලත්ව නොතිබුණි. ටයිල් ඇතිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ එකඟ වූ මිල | ප්‍රසම්පාදන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |

| | | | |
|---|---|---|---|
| | රු.1,299,667 ක් වුවත් රු.1,244,782 ක් සඳහා පමණක් අනුමැතිය ලැබී තිබූ හෙයින් රු.54,885 ක් සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. | | |
| (ආ) | සභා රැස්වීම් ශාලාවේ පිටුපස නාම පුවරුව අඟල් 8 අකුරුවලින් නිමකිරීමට රු.110,000 කට ගිවිසුම්ගතවී තිබුණද අඟල් 7 අකුරුවලින් නිම කිරීමට රු.225,000 ක් ගෙවීම් කර තිබූ හෙයින් රු.115,000 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබූ අතර පැන්ට්‍රි කබඩ් සඳහා රු.206,360 ක් ඇස්තමේන්තු කර ගිවිසුම් ගතව තිබූ අතර භාවිත කළ යුතු ලී පිළිබඳව සඳහන් කර නොතිබුණි. 2018 දෙසැම්බර් 05 දින පරීක්ෂාවේදී එය ශක්තිමත් නොවූ ලීයෙන් තනා නිමකර තිබුණි. | ඇස්තමේන්තු සමස්ත කාර්යය වෙනුවෙන් සකස් කළ යුතු අතර ඇස්තමේන්තුව හා ගිවිසුම අනුව ගෙවීම් කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| (ඇ) | වැවල පල්ලිය පටුමග ගල් අතුරා තාර දැමීමේ කර්මාන්තය සඳහා රු.262,133 ක් වැය කර 2018 අගෝස්තු 31 දින නිම කර තිබුණු අතර 2018 සැප්තැම්බර් 18 දින භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ මතුපිට තාර ගැලවී ගොස් තිබුණි. | අදාල කාර්ය නිසි පරිදි ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |
| (ඈ) | කණුවන නගර සභා සීමාවේ සිට නගර සභා සීමාවේ අවසානය දක්වා දෙපා ඇල මැෂින් යොදා ශුද්ධ කිරීම සඳහා රු.343,980 ගෙවීම් කර තිබුණද 2018 ඔක්තෝබර් 19 දින භෞතික පරීක්ෂාවේදී මැෂින් යොදා තිබූ බවක් දක්නට නොලැබූ අතර, ඉතාමත් පටු ප්‍රදේශ හා නිවාස අතරින් ගලාගෙන යන මෙම ඇල ප්‍රදේශයට යන්ත්‍ර යෙදවිය නොහැකි විය. | කාර්යයන් ඉටු කිරීමේදී තාක්ෂණික නිලධාරියෙකුගේ අධීක්ෂණය හා නිර්දේශ අවශ්‍ය වේ. | පිළිතුරු ඉදිරිපත් කර නැත. |